www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# මැක්කේන් සහ වියට්නාමය : අලුත් යුද්ධයන්ට ඉඩසැලසීමට ඉතිහාසය ප්‍රතිශෝධනය කිරීම (නැවත ලිවීම)

**McCain and Vietnam: Revising history to pave the way for new wars**

**බිල් වාන් ඕකන් විසිනි**
**2008 ජුනි 18**

ඇරිසෝනා සෙනට් සභික රිපබ්ලිකන් පක්ෂයේ අනුමානගත ජනාධිපතිවරන අපේක්ෂක ජෝන් මැක්කේන් එ.ජ. මාධ්‍ය මගින් "වියට්නාම යුධ වීරයෙක්" ලෙස චර්යානුගතව හඳුන්වනු ලැබේ. පසුගිය මාසය පුරාවට, කතාවක් හැර කතාවකදී, ඔහුගේ ඩිමොක්‍රටික විරුද්ධවාදියා වන සෙනට් සභික බැරැක් ඔබාමා, රිපබ්ලිකන් මැක්කේන්ගේ ප්‍රතිපත්ති විවේචනයන්ට පූර්විකාව ලෙස "නියම යුධ වීරයෙක්", "තම රට සඳහා වීරත්වයෙන් සේවය කල අයෙක්", "අප අගය කරන යුධ සේවයක් සහිත ඇමරිකානු වීරයෙක්" වැනි තම විශ්වාසයේ ප්‍රකාශනයන් වන යෙදුම් යොදා ගනු ලැබීය.

එවන් අලංකාරෝත්තියක් සම්ප්‍රදායික දේශපාලන ඥනය විසින් ප්‍රතික්ෂේප කරන බවට සැකයක් නැති අතර, එක් අතකින් රිපබ්ලිකන්වරු එය අපේක්ෂකයාගේ පැකේජයට එකතු කරද්දී, අනෙක් අතට, යුධ අත්දැකීම් නොමැතිවීම ඩිමොක්‍රටික අපේක්ෂකයා හට උපායශීලී පහරක් වන අතර එම වචනවල දැඩි ගැඹුරක් සහ වඩා දේශපාලන වැදගත් බවක් පවතී.

තම දෙවන බිරිඳගේ පවුලේ ධනයෙන් මුදල් යොදවනු ලැබීමෙන් සහ ඇරිසෝනාහි දූෂිත ව්‍යාපාරිකයෙක් වන චාර්ල්ස් කීටින්ගේ උදව් මතින්, සාර්ථක දේශපාලන ගමනකට ප්‍රවිශ්ඨ වුන මැක්කේන් "යුධ වීර" ලේබලයකින් හැඳින්වීමෙහි වෛෂයික ප්‍රභවය කුමක්ද?

නාවික ගුවන් නියමුවෙකු ලෙස දශකයක් පුරා එතරම් විශේෂිත නොවූ රාජකාරියක නිරත වූ තරු හතරේ නාවික අද්මිරාල්වරුන්ගේ පුතෙකු සහ මුනුබුරෙකු වන මැක්කේන්, 1967 ඔක්තෝම්බරයේදී උතුරු වියට්නාමයේදී වෙඩි තබා බිමහෙලනු ලැබීමෙන් පසු වසර පහ හමාරක් වියට්නාමයේ යුධ කඳවුරක සිරකරුවෙක් ලෙසට පත්විය.

ඔහු තම ගුවන් යානය බිම හෙලනු ලැබීමට පෙර, දකුනු චීන මුහුදේ නතරකර තිබුනු ඇමරිකානු ගුවන් යානා නැවක සිට කෙටි ගුවන් ගමන් මගින් වියට්නාම් අහසේ සිට පහල ඇති නගර හා මිනිසුන් මතට අධි බලැති පුපුරන ද්‍රව්‍ය හෙලමින් පැය 20කට ආසන්න කාලයක් ගතකර තිබුනි.

වියට්නාම් ජනතාවගේ අධිෂ්ඨාන ශක්තිය බිඳදැමීමේ උත්සාහයක් ලෙස, ජනාධිපති ලින්ඩන් ජොන්සන් විසින් දියත් කල "රෝලින් තන්ඩර්" මෙහෙයුමට සහභාගී වීමට ඔහු සිය කැමැත්තෙන්ම ඉදිරිපත් විය. රටෙහි ආර්ථිකය සහ යටිතල පහසුකම් විනාශකිරීමට හා රට වැසියන් විශාල සංඛ්‍යාවක් ඝාතනය කිරීමට හෝ තුවාල සිදුකිරීමට නොනවතින බෝම්බ ප්‍රහාර දියත් කිරීම මෙහි අරමුන විය.

යුද්ධය අවසන් වීමට පෙර, ප්‍රමානයෙන් නව මෙක්සිකෝව තරම් වූ එම රට මතට, සමස්ථ දෙවන ලෝක යුද්ධයේදී හෙලනු ලැබූ බෝම්බ ප්‍රමානය මෙන් හතර ගුනයක් එනම් ටොන් මිලියන අටකට ආසන්න පුපුරන ද්‍රව්‍ය එ.ජ. යුධ ගුවන් යානා හෙලුවේය. ඉතිහාසයේ වඩාත්ම බලවත් සහ නොනවතින බෝම්බ මෙහෙයුම වුන මෙය, වියට්නාම් නගර සුනු විසුනු කල අතර එහි කර්මාන්ත, ගමනාගමන, සහ විදුලි සංදේශ යටිතල පහසුකම් විනාශ කලේය.

යුද්ධය අවසන් වීමට පෙර, මිලියන පහක පමන වියට්නාම් ජාතිකයන් පිරිසක් ඝාතනය කෙරුනු අතර ඒ අතරින් බොහෝ දෙනා එ.ජ. ගුවන් බෝම්බ ප්‍රහාරවලට ගොදුරු වූවන්ය.

*වියට්නාමයඃ ඉතිහාසයක්* නම් තම පොතෙහි ස්ටැන්ලි කාර්නොව් නමැති ප්‍රසිද්ධ මාධ්‍යවේදියා බෝම්බ ප්‍රහාර ගැන වියට්නාම් ගැමියෙකුගේ විස්තරයක් මෙසේ ඉදිරිපත් කරයිඃ "බෝම්බ ප්‍රහාරය උදෑසන අටට පමන ආරම්භ වෙලා පැය ගනනාවක් පැවතුනා. පිපිරීම් පලමුව ඇහුනවිටම අපි බිංගෙය තුලට රිංගුවත් හැමෝටම එය කරන්නට බැරිවුනා. ප්‍රහාරය නැවතුන අවස්ථාවකදී උඩට ඇවිල්ලා කුමක් කල හැකිදැයි

බැලූ අප කිහිප දෙනෙකු දැක්කේ භයංකාර දර්ශනයක්. සිරුරු කැලිවලට කැඩිලා අත් පා කොටස් ගස්වල එල්ලෙමින් හා බිම පුරා විසිරිලා තිබුනා. බෝම්බ දැමීම නැවත පටන් ගත්තා. මේ වතාවේ නාපාම් සමග ගම ගිනි ජාලාවකින් වෙලා ගත්තා. නාපාම් බෝම්බයක් මට වැදුනා. මට දැනුනා අගුරු කැල්ලක් වගේ මගේ සර්වාංගෙම පිච්චෙනව වගේ. මට සිහිය නැතිවුනා. යාලුවෝ මාව ඉස්පිරිතාලයට ගෙනිහින් තිබුනා. මාස හයක් ගතවෙන තුරුත් මගේ තුවාල හොඳවෙන්න පටන් ගත්තේ නෑ. මගේ අම්මත්, නැනත්, හා බෑනාවරු තුන් දෙනෙකුත් ඇතුලුව 200 කට අධික පිරිසක් එම ප්‍රහාරයෙන් මියගියා. බිංගෙය කඩා වැටිලා ඔවුන් පන පිටින් යටවෙලා."

මේ විස්තරකෙරෙන්නේ වීරත්වයේ ක්‍රියාවක් ගැන නොවන නමුත්, පෘථිවියේ යුධ ශක්තියෙන් වඩාත් බලවත් ජාතියක් විසින්, දිලිඳු වූ සහ ඓතිහාසිකව පීඩාවට ලක්වූ රටකට එරෙහිව ගෙනගිය යුධ අපරාධයක් ගැනයි.

මැක්කේන් වෙඩි තබා බිම හෙලන විට, ඔහු හැනෝයිහි බොහෝ ජනාකීර්න ප්‍රදේශයක පිහිටි බලාගාරයකට එවැනිම බෝම්බ ප්‍රහාරයක් සම්පූර්න කරමින් සිටියේය.

හැනෝයිවලට පැරෂුටයක් මගින් ගොඩබැසීමෙන් පසු, මැක්කේන්ගේ දිවි ගලවාගැනීම වියට්නාම්වරුන්ගේ මානුෂිකත්වය ගැන සාක්ෂිවන අතර එය විශේෂිතවම එක් වියට්නාම් කම්කරුවෙකුට නය ගැතිය. ඔහු තුවාල ලද ගුවන් නැවියා ගොඩ බැස්ස වැවෙහි පිහිනා, ගිලෙන්නට පෙර ඔහුව ගොඩට ගෙනවුත් කෝපගැන්වුනු පිරිසගෙන් ඔහුව ආරක්ෂා කරගත්තේය.

මිනිසුන්, ගැහැනුන්, සහ ලමුන් කැබලි කල සහ නිවාස පස් ගොඩවල් බවට පත් කරමින් බෝම්බ ප්‍රහාරයක් දියත් කල, කිසිඳු ප්‍රහාරයකට ලක්නොවුනු රටක ගුවන් නැවියෙකු, එ.ජ. ෆීනික්ස් හෝ වෙනයම් නගරයකට පැරෂුටයකින් බැස්සහොත් සිදුවිය හැකි දෙය කෙනෙකුට සිතාගැනීමට පුලුවන.

1997 දී සීබීඑස් රූපවාහිනියේ "මිනිත්තු 60" නම් ප්‍රවෘත්ති වැඩසටහනට කල සම්මුඛ සාකච්ඡාවකදී, " මම යුධ අපරාධකරුවෙක්. මම අහිංසක ගැහැනුන්ට සහ ලමුන්ට බෝම්බ හෙලුවා." මැක්කේන් අවංකවම පිලි ගත්තේය. මෙය ඔහුව ජනාධිපති කිරීම සඳහා බලපාන තර්කයක් නොවුනත් එය අවංක ප්‍රකාශයක් විය.

බොහෝ දුරක සිට ප්‍රහාර එල්ල කලත් ඝාතන පැත්තෙන් සැලකු කල සෑම එකක්ම මයි ලායි සමූල ඝාතනය තරමටම විනාශකාරී වූවාට සැක නැති වුවද ඔහු යුධ අපරාධකරුවෙක් බවට පත්වන්නේ හුදු ඔහුගේ පුද්ගලික ක්‍රියාකාරකම් වල පිලිඹිඹුවකින් නොවේ. එය යුද්ධයේම වෛෂයික ලක්ෂනයක් වන කාරනාවකි. වියට්නාමයේදී, අපරාධකාරී සහ ප්‍රතිවිප්ලවවාදී ප්‍රචන්ඩ යුධයක් ගෙනයෑම සම්බන්ධව ආන්ඩුවේ ඉහල තලයේත්, මිලිටරියේ හා බුද්ධි අංශ වලත්, ප්‍රධාන පක්ෂ දෙකෙහිත් වඩා බරපතල වගකීම් දැරූ බොහෝ පුද්ගලයන් සිටි බව පැහැදිලිය.

නාසීන්ගේ බිඳවැටීමෙන් පසු සිදුවූ බරපතල යුධ අපරාධ සම්බන්ධව තමාගේම වගකීම වසන්කරගැනීමත්, රටතුලදී මහජන විරෝධතා සහ සමාජ අරගල තත්වයන් යටතේ එ.ජ. අධිරාජ්‍යවාදයේ පරාජයේ දේශපාලන මතකය මකාදැමීමත්, සඳහා වියට්නාම් යුද්ධයේ ඉතිහාසය වෙනස් කිරීමේ උත්සාහයක ඇමරිකානු පාලක ප්‍රභූව දශක තුනකටත් වඩා කාලයක් වැය කර ඇත.

අවම වශයෙන් පලමු බුෂ් පරිපාලනයේ පටන්, " වියට්නාම් සින්ඩ්‍රෝමය" ට පහරදීම පාලක පැලැන්තිය තුල ප්‍රකාශිත අරමුනක් විය. වියට්නාමයේ තිත්ත උරුමය වුන, එ.ජ. ආක්‍රමනික යුද්ධ සම්බන්ධ මහජන පිලිකුල, කෙසේ හෝ අතුගා දැමීමට පලමු ගල්ෆ් යුද්ධය සහ ඊට පසු ඉරාක ආක්‍රමනය, උපකාරී වනු ඇතැයි බලාපොරොත්තු විය.

1997දී මැක්කේන්ගේ පිලිගැනීම හැරුනු විට, ඔහුව යුධ වීරයෙක් ලෙස සිංහාරූඪ කිරීම මෙම උත්සාහයේ වැඩි කොටසක් වේ. ඒ අතරතුර, වියට්නාම් යුද්ධය ගැන ඔහුගේම සංකල්ප, ඉරාකය සහ ඉරානයට එරෙහිව පවතින නව යුධ විභවය එල්ල කරගත් ඔහුගේ ආකල්ප හැඩ ගැන්වීමේ වැදගත් කාර්යභාරයක් ඉටු කර ඇත.

තමා නිදහස් වීමෙන් වසරකට ආසන්න කාලයකට පසු, 1974 දී, ජාතික යුධ පාසැලට අනුයුක්තව සිටින අතර ලියන ලද රචනාවක් මත පිහිටා, ඉරු දින නිව්යෝක් ටයිම්ස්හි පලවූ ලිපියක්, වියට්නාමයේදී ඔහු ලද වෙහෙසකාරී සහ හැඩගැස්වූ අත්දැකීම් මතින් මැක්කේන් විසින් ඉගෙන ගත් පාඩම් පිලිබඳව නව ආලෝකයක් සැපයුවේය. බොහෝ නිලධාරීන්, එ.ජ.ය වියට්නාමයට ප්‍රහාරක හමුදා කවදාවත්ම නොයැවිය යුතුව තිබුනේ යැයි නිගමනය කලත්, ටයිම්ස් පුවත්පතට අනුව, මැක්කේන්ගේ රචනාව "සටන සඳහා මහජන සහයෝගය දිගටම පවත්වාගෙනයාමට නොහැකිවීම කේන්ද්‍රගත කර" ඇත.

"යුද්ධයේ නීතිමයභාවය ප්‍රශ්නකරන" යුධ සිරකාර සගයන් "කොමියුනිස්ට් ප්‍රචාරයට උඩගෙඩිදෙන්නන්" ලෙස විවේචනය කල ඔහු, එ.ජ.ය තුලම සිටින " බෙදුනු බලවේග" වලට චෝදනා කලේය.

විෂ නැසීමක් ලෙස, ආන්ඩුවේ විදේශ ප්‍රතිපත්තියේ අරමුනු ගැන, එ.ජ. හමුදාවන්ට වඩා වේගවත් ප්‍රගුනකරවීමක් ඔහු යෝජනා කලේය. "එවන් ආකාරයක

වැඩසටහනක් මොලසේදීමක් ලෙස වටහා ගනු ඇතැ"යි පිලිගන්නා අතරම, රජය විසින් ඇමරිකානු ජනතාවට එහි විදේශ ප්‍රතිපත්තියෙහි සමහර මූලික කරුනු හඳුන්වා දෙනු ලැබීමට, වඩා ප්‍රචන්ඩකාරී උත්සාහයක් ගත යුතු යැයි ඔහු  යෝජනා කලේය.

ඇත්ත වශයෙන්ම, මිලිටරියේ බොහෝ දෙනා මෙන්ම ඇමරිකානුවන් මිලියන ගනනක් "යුද්ධයේ නීතිමයභාවය ප්‍රශ්නකලේ" එය සත්‍ය ලෙසටම ආක්‍රමනික අපරාධකාරී යුද්ධයක් හේතුවෙනි. වැඩිමනත් ලෙසට, 60,000ක් හමුදා භටයින් මරනයට පත්කල සහ දස දහස් ගනනක් ශාරීරිකව හා මානසිකව විනාශකෙරුනු මෙම යුද්ධයට මිල ගෙවීම දිගටම කරගෙන යන්නට ඇමරිකානු වැඩ කරන ජනතාව සූදානම් වූයේ නැත. ඒ අතරතුර, ලෝකය පුරාම ජනතාව යුද්ධය අපරාධයක් සහ සදාචාරාත්මක අපකීර්තියක් ලෙස සැලකූහ.

කෙසේ වුවද, නාවික සහ ගුවන් හමුදා නියමුවරු ගනනාවක් යුද්ධය ගැන වෙනස් නිගමනවලට එලඹ සිටියහ. වියට්නාමයට එරෙහි අහසින් කෙරෙන යුද්ධයකදී ඕනෑම සීමා කිරීමක් ගැන කිපුනු සහ " ඔවුන්ව ගල් යුගයට යන ලෙසට බෝම්බ දැමිය යුතුයැ"යි යෝජනා කල හිටපු ගුවන් හමුදා ප්‍රධානී කර්ටිස් ලීමේ, ඔවුන් අතරින් වඩාත් කැපී පෙනිනි. වියට්නාම් නගරවලට අනුකම්පා විරහිත බෝම්බ ඇතිරීමක් කරගෙන යාමට එ.ජ. යට අවශ්‍ය බවට විශ්වාස කල මෙබඳු කොටස්, රෝලින් තන්ඩර් ව්‍යාපාරයේ මුල් අවස්ථාවේදී, ජොන්සන් පරිපාලනය පිලිබඳව අතිශයින්ම විවේචනශීලී විය. වියට්නාම් ජනතාවගේ ආත්ම ශක්තිය බිඳදැමීමට නොහැකිවුනු සහ ඇමෙරිකානු හමුදා රටෙන් ඉවත්කරගැනීමට පාර කැපූ, දාමරිකකමක් වුනු 1972 ඊනියා නත්තල් බෝම්බ ප්‍රහාරය සඳහා, 200 බී-52 ප්‍රහාරක යානා සඳහා ඉඩ දීම ගැන ඔවුහු නික්සන්ව පැසසූහ.

ඔහු තම රචනාව ලියූ ජාතික යුධ පාසලේ ඔහුගේ කාල සීමාව, යුද්ධය සහ විදේශ ප්‍රතිපත්තිය වැනි කරුනු ගැන ඔහුගේ ප්‍රතිපත්ති ස්ථාවර කෙරුනු කාල පරිච්ඡේදයක් ලෙස, , මැක්කේන් විස්තර කර තිබේ. වෙනස් මිලිටරි උපායමාර්ගයක් දිගටම අනුගමනය කලේ නම් සහ යුධ විරෝධී සංවිධාන, මාධ්‍ය, හා ඩිමොක්‍රටික පක්ෂයද ඇතුලු "බෙදුනු බලවේග" වල බලපෑමට යටත් නොවූයේ නම්, එ.ජ.යට වියට්නාම් යුද්ධය ජයගත හැකිව තිබිනි යන්න ඔහුගේ මූලික නිගමනයයි.

වියට්නාම් යුද්ධය සම්බන්ධව මැක්කේන් යලිත් ලිවීම සුවිශේෂිත කරුනක් නොවේ. දශක ගනනාවක් පුරා දිවෙන ප්‍රධාන දෘෂ්ඨිවාදාත්මක ව්‍යාපාරයක් වන මෙය රැම්බෝ චිත්‍රපට වැනි ජනප්‍රිය සංස්කෘතික නිෂ්පාදිතවල පවා ප්‍රකාශනය අත්කර ගෙන ඇත. එහි අවසන් අවශ්‍යතාවය වන්නේ, වසර 100 පුරා එ.ජ, හමුදා රඳවන්නට ගැටලුවක් නොමැති බවට මැක්කේන් පවසන ඉරාකය තුල යුද්ධය සහ පැරනි බීච් බෝයිස් තාලයට "බොම්බ්, බොම්බ්, බොම්බ් ..... බොම්බ්, බොම්බ් ඉරාන්" යැයි ගායනා කරමින් තම අදහස ප්‍රකාශ කල ඉරානය වැනි නව එ.ජ. ආක්‍රමනික යුද්ධ සඳහා මග සැලසීමයි.

මෙම දෘෂ්ඨිවාදාත්මක ව්‍යාපාරයට ඩිමොක්‍රටික පක්ෂයේ උදව් උපකාර කිරීම ආරම්භ කෙරුනේ මැක්කේන්  "යුධ වීරයෙක්" ලෙසට කෙරෙන නියාලු වර්නනාව සමග නොවේ. එ.ජ. අධිරාජ්‍යවාදයේ පරාජයට වගකිව යුත්තේ තම යුධ විරෝධී කන්ඩායම යැයි දක්ෂිනාංශයෙන් කෙරෙන චෝදනාවට බියෙන් පක්ෂය දශක ගනනාවක් පුරා පසුබැස තිබේ.

ඒ අතරතුර, විරුද්ධ පාක්ෂිකයාගේ යුධ වාර්තාවට ප්‍රහාර එල්ල කිරීම පිලිබඳව රිපබ්ලිකන්වරු කිසිම පැකිලීමක් නොදැක්වීම සඳහන් කරනු වටී. 2004 දී, වියට්නාම් යුද්ධයෙන් පෙරලා පැමිනි පසුව යුද්ධයට එරෙහි වීම ගැන, ඩිමොක්‍රටික ජනාධිපතිවරන අපේක්ෂක වුන ජෝන් කෙරී හට නින්දා කරන්නට පමනක් නොව, කෙරීට රිදී පදක්කමකින් පිදුනු සටනක් ඇත්තටම පැවතුනේද යන්න ප්‍රශ්න කිරීමටද, ඔවුහු " ස්විෆ්ට්බෝට් වෙටරන්ස් ෆෝ ට්‍රෑත්" සංවිධානය ගොඩනැගූහ.

අවුරුදු 30කට පෙරාතුව සිදු කෙරුනු අපේක්ෂකයාගේ යුද විරෝධී ව්‍යාපාරය වල දමන්නට, උපරිම ලෙස ක්‍රියා කල ඩිමොක්‍රටික්වරු හා කෙරී " තමන්ගේ රට බේරාගන්නා හැටි දන්නා" "යුධ වීරයෙක්" ලෙසට ඔහුව හඳුන්වා දෙමින් ඔවුන්ගේ කොටස ඉටු කලහ.

මැක්කේන්ගේ යුධමය වාර්තාවට, ඩිමොක්‍රටික්වරුන් මේ දින වල නොනවත්වා "ගරුසරු දැක්වීම" වැනි මෙම ව්‍යාපාරයේ අතිශයෝක්ති සහගත බලපෑම, වියට්නාම් යුද්ධය පුනරුත්ථාපනයට උදව්කිරීමටය.

මෙම පුනරුත්ථාපන ප්‍රයත්නය, අතීතය පිලිබඳ කිසියම් නව දැක්මක් මත පදනම් නොවන අතර එම දරුනු යුද්ධය පිලිබඳ නව පරපුරෙහි අඩු දැනීම හා දරුනු මතකයන් තුනී වී ඇතැයි යන ගනන් බැලීම මත පදනම් වී ඇත.

ඉරාකයේ තමන්ගේ අවශ්‍යතා හොඳින්ම ඉටුකර ගන්නේ කෙසේදැයි උපායාත්මක නොඑකඟතාවයන් පැවතියේ වුවත්, ඩිමොක්‍රටික්වරු සහ රිපබ්ලිකන්වරු යන දෙගොල්ලන්ම විසින් යොදා ගනු ලබන මෙම ඓතිහාසික සංශෝධනවාදය අවසානයේදී දුවවනු ලබන්නේ පාලක ප්‍රභූ පැලැන්තියේ ඒකමතිකභාවය විසිනි. ඇමරිකානු අධිරාජ්‍යවාදයේ උපායමාර්ගික අස්ථානය ආරක්ෂා කිරීමට, අලුත් සහ වඩා දරුනු යුධ අපරාධ අවශ්‍ය වන බවට, ඔවුහු එකඟවෙති.

"අප ජය ගත යුතු යුද්ධයක්" ලෙසට ඇෆ්ඝනිස්ථානය විස්තර කල, පකිස්ථානයට ඒකමතික ප්‍රහාර යෝජනා කල, ජෝන් මැක්කේන් යෝජනා කල හමුදාවට වඩා විශාල හමුදාවක් යෝජනා කල, ඔබාමා පිලිබඳ සත්‍යය මීට අඩු නැත.

මේ තත්වයන් යටතේ සහ තම රටෙහිදී තියුනු සමාජ අරගලයන්ටද පිටරටදී යුද්ධ වලටද යලිත් ඇමරිකානු වැඩ කරන ජනතාව මුහුන දෙන තතු තුල වියට්නාමයේදී එ.ජ. අධිරාජ්‍යවාදයේ පරාජයේ සත්‍ය ඉතිහාසය ආරක්ෂා කිරීම බොහෝ ලෙසම අත්‍යාවශ්‍ය කාරනාවකි.

© www.wsws.org